# ව්‍යවසායකයෙක් සතු සමාජීය වගකීම්

**වජිර පෙරේරා**
**අධ්‍යක්ෂ - ව්‍යවසායකත්ව හා**
**උපදේශක සේවා මධ්‍යස්ථානය**

සමාජයීය වගකීම් යනු, ව්‍යාපාරික ආයතනයක් තුළින් තම සමාජයේ යහපත උදෙසා ඉටුවියයුතු සියළු යුතුකම්වල එකතුවකි. එබැවින් මෙම යුතුකම් නොපිරිහෙලා ආයතනය මගින් සමාජයට ඉටුවිය යුතුය.

ආයතනයේ ප්‍රමාණය කුමක් වුවද එය ස්වයං රැකියාවක් විය හැකිය. එමෙන්ම කුඩා හා මධ්‍යම පරිමාණයේ ආයතනයක් විය හැකිය. එසේත් නැත්නම් මහා පරිමාණයේ ව්‍යාපාරයක් විය හැකිය. මේ කුමක් වුවත් තම තීරණ ගැනීමේදී අවට පරිසරය හා වෙසෙන මහජනතාව කෙරෙහි සැලකිලිමත්වීම ව්‍යවසායකයකුගේ වගකීමකි. තම ව්‍යාපාරය නිසා පරිසරයට හා අවට වෙසෙන ජනතාව අපහසුතාවකට පත්වේ නම්, ඒගැන නැවත වරක් සිතාබැලීම වගකීම් දරණ ව්‍යවසායකයකුගේ ලක්ෂණයකි. එමෙන්ම, තම ව්‍යාපාරය හා සමාජය අතර ජාලයක් ගොඩනැගීමත්, එය ඉතා සහයෝගීව දිගු කලක් පවත්වා ගෙන යාමත් උසස් ගුණාංගයක් ලෙස දැක්වේ.

ඕනෑම ව්‍යවසායකයකුට මෙම වගකීම්වලට නිතර මුහුණදීමට සිදුවන අතර, සමහර අවස්ථාවලදී ඔවුන් නොදැනුවත්වම මේවා සපුරාලීමට ක්‍රියාකරනු ඇත. පාරිභෝගිකයන් භාණ්ඩ තේරීමේදීත්, ඒවා මිලට ගැනීමේදීත්, ව්‍යාපාර සහායකයින් ආයෝජනය කිරීමේදීත් සහ කිසිවකු ව්‍යාපාරික ආයතනයකට බඳවා ගැනීමේදීත් ව්‍යවසායකයා විවිධ අයුරින් වගකීම් දැරිය යුතුය.

ප්‍රථම අවස්ථාවේදී පාරිභෝගිකයාට සාධාරණ මිලකට හා උසස් තත්ත්වයෙන් යුත් භාණ්ඩ සැපයීමටත්, දෙවන අවස්ථාවේදී ආයෝජකයන් ලබාදුන් ප්‍රාග්ධනය සඳහා ප්‍රතිලාභ ලබාදීමත්, තුන්වන අවස්ථාවේදී තම සේවකයන්ගේ රැකියාවේ සුරක්ෂිතභාවය රැකදීමත් යන විවිධ වගකීම් ඉටුකිරීමට ව්‍යවසායකයාට සිදුවනු ඇත.

දිගු පැවැත්මක් සතු ව්‍යවසායකයකු ආර්ථිකමය, පාරිසරික හා සමාජමය යන වගකීම් තුනම ඉටුකළ යුතුය. සමාජයීය වගකීම් යනු මේ වගකීම් වර්ග තුනෙහිම එකතුවක් වන අතර, ඒවා සේවා ආයතන, මානව හිමිකම්, සමාජමය හා වෙළඳපොළ යන සාධක මත ද බලපානු ඇත. සමාජයීය වගකීම් සපුරාලීමෙන් එය ව්‍යාපාරවල පැවැත්මට මෙන්ම සමාජයට මෙහෙවරක් වන අතර, එමගින්, ආයතනයට ද පිළිගැනීමක් ලැබේ.

## සමාජීය වගකීම්

සමාජීය වගකීම් ප්‍රධාන කොටස් පහක් යටතේ ගොනු කළ හැකිය. පළමුවැන්න අපේ පරිසරය රැකගැනීම. මේ සඳහා දෙවැදෑරුම් පිළිවෙතක් අනුගමනය කළ යුතුය. එනම් පරිසරය දූෂණය කිරීමෙන් වැළකීසිටීමත්, තිබෙන ස්වාභාවික සම්පත් නියමාකාරයෙන් ප්‍රයෝජනයට ගැනීමත් යන කරුණු දෙකයි.. පරිසරය හා බැඳුණු වගකීම් මෑත කාලයේදී ඉතා වැදගත්වුණු අතර, විශේෂයෙන් තුන්වන ලෝකයේ රටක් ලෙස අපට මේ කෙරෙහි විශේෂ බලපෑමක් කිරීමටද සිදුවී ඇත. ඒනිසාවෙන් ISO 14001 තත්ත්ව පද්ධතියත්, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රියකරණය සහ අපද්‍රව්‍ය අවමකරණය මෙහිලා වැදගත්වේ. මේ සඳහා විදේශීය මූල්‍යමය හා තාක්ෂණික දැනුම ද ලබාදුන් අතර, එහි ප්‍රධාන අරමුණ වූයේ, අපේ ව්‍යවසායකයන්ගේ දියුණුව සැලසීමයි.

පරිසරය රැකගැනීමේ ක්‍රියාවලියේදී අපේ බොහෝමයක් ව්‍යවසායකයන් ඒ සඳහා යොමුවී ක්‍රියා කිරීමට මැලිකමක් දැක්වුවද රජයෙන් පනවන ලද නොයෙක් නීති හා කොන්දේසි මත ඊට අනුකූලවීමට සිදුවේ. ව්‍යවසායකයන්ගේ අනාගත පැවැත්ම ගැන සලකන කළ මෙය එතරම් සුභදායක නොවන බව කිව යුතුය. පරිසරය රැකීමට අපේ ව්‍යවසායකයන් ස්වෝත්සාහයෙන් යොමුවිය යුතු අතර, නහංචි පනවා පරිසරය රැකීමට යොමු කිරීම වගකීම් පැහැර හැරීමේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකිය.

අපේ සීමිත ස්වාභාවික සම්පත් ඉතා පිරිමැසුම් සහගතව භාවිතයට ගැනීම ව්‍යවසායකයන් සතු තවත් වගකීමකි. එලෙසම ලබාගත් සම්පත් හා ආශ්‍රිත ප්‍රදේශ නිසි ලෙස කළමණාකරණය කිරීම ව්‍යවසායකයකු සතු වගකීමකි.


දෙවැන්න නම්, මහජන සහභාගීත්වයයි. මෙහිදී ජනතා සහභාගිත්වය, විදේශ සම්බන්ධතාව, භාණ්ඩ හා සේවා මෙන්ම පරිත්‍යාග ද, සැලකේ. ව්‍යවසායක ප්‍රජාව මගින් මුදල් පරිත්‍යාග, ඒ සඳහා කාලය මිඩංගු කිරීම, භාණ්ඩ ප්‍රදානය කිරීම හා ශිෂ්‍යත්ව ප්‍රදානය යන සේවාවන් ජනතාව වෙත ලබාදෙනු ඇත. මෙම ක්‍රියාවලියේදී භාණ්ඩ හා සේවා වලින් ජනතාවට ලැබෙන ලාභ ප්‍රයෝජනවලට අමතරව ව්‍යවසායකයන්ට ඔවුන්ගේ ව්‍යාපාරික භාණ්ඩවල වෙළඳ නාමය, මෙන්ම ව්‍යාපාරික කීර්තිය ද ලැබෙනු ඇත. මෙය වාණිජමය උවමනාවක් ඇති සියළු දෙනාටම වැදගත් වන බැවින්, එය ව්‍යවසායකයින්ට නිතැතින්ම ධනාත්මක පිටුවහලක් වනු ඇත.

තෙවනුව, ජාතික විපතකදී ව්‍යවසායකයන් වශයෙන් අපට මානුෂික දායකත්වයක් ලබාදිය හැකිය. හොඳම උදාහරණය ලෙස පසුගිය "සුනාමි " ඛේදවාචකය

ගෙනහැර දැක්විය හැකිය. මිට අමතරව බඩු මිළ ඉහළ යාමේදී හා භාණ්ඩවල හිඟයක් පවතින විටකදී වෙළඳපොළ කෙරෙහි සුභදායක බලපෑම් කිරීමට ව්‍යවසායකයින්ට හැකිවිය යුතුය. මහජනතාවට වන අපහසුව යම්තාක් දුරට අවම කරගැනීමට එය ඉවහල් වනු ඇත.

සිව්වෙනුව , ව්‍යාපාරික ප්‍රමිතීන්ට අනුකූලවීම හා ව්‍යාපාර ආචාර ධර්මයන් සුරැකීම ව්‍යවසායකයින්වන අපගේ වගකීම වන අතර, මෙම ප්‍රමිතීන් ගෝලීයකරණයත් සමග වඩාත් ඍජුව පවත්වාගෙන යාමට සිදුව ඇත. මෙනිසා සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් හට මීත් සමහර ආචාර ධර්ම/ ප්‍රමිතීන් අනුගමනය කිරීම අපහසු කාර්යයක් වී ඇත. කෙසේ වෙතත් අපගේ බොහොමයක් ව්‍යවසායකයින් තම කැමැත්තට අනුව මෙම ප්‍රමිතීන් අනුගමනය නොකළ ද එය නියම අයුරින් පිළිපැදීම ව්‍යවසායකයන් සතු වගකීමක් වනු ඇත.

පස්වෙනුව, ව්‍යවසායකයින් මගින් ආයතන දියුණුව හා ආර්ථික දියුණුව සලසා ගැනීම. මෙහිදි ස්වයං රැකියාවල නියුතු අය, මහා පරිමාණයේ ආයතන හා එක්ව ආර්ථික සංවර්ධනයක් ලබාගැනීමට ක්‍රියා කළ යුතුය. මෙය රටේ දේශීය දළ නිෂ්පාදනය නැංවීමටත් ඉවහල් වනු ඇත. එමෙන්ම බහු ජාතික සමාගම් මගින් මූල්‍යමය, කළමණාකරණ හා කාර්මික විශේෂඥ දැනුම කුඩා ව්‍යාපාරිකයන් හා ස්වයං රැකියාවල නිරත වූවන්ට ලබාදිය යුතුය. මෙහි ප්‍රතිඵලයක් ලෙසින් බොහෝ බහු ජාතික සමාගම් තම භාණ්ඩ සැපයුම්කරුවන්ට වරින්වර දැනුම ලබාදීමටත් හා ආයතන පරීක්ෂා කරමින් ඒවායේ තත්ත්වය නැංවීමටත් කටයුතු කරගෙන යනු ලබයි.




**ව්‍යාපාරයක් බාහිර බලපෑම් කරන අයට වගකීමට බැඳී සිටී**

## සමාජයීය වගකීම් ඉටු කිරීමෙන් ව්‍යවසායකයින්ට ලැබෙන වාසි හා ප්‍රතිලාභ

- සමාජයෙන් ලැබෙන ධනාත්මක ප්‍රතිචාරය. මෙය හුදෙක් සිතෙහි උපදවන ප්‍රතිචාරයකි. විශේෂයෙන්ම ආයතනය හා බැඳී ආයෝජකයින්, පාරිභෝගිකයින් හා සැපයුම්කරුවන් මතින් මෙම ප්‍රතිචාරය ලබාගත යුතුය. මෙම ධනාත්මක ප්‍රතිචාරය ලබාගැනීමට ව්‍යවසායකයා තම සමාජීය වගකීම් සපුරාලිය යුතු අතර, ප්‍රතිචාරය ව්‍යාපාරයේ ලාභ ඉපයීමේ ක්‍රියාවලිය වැඩිකිරීමට උපයෝගී වේ. සමාජයේ නිරන්තර විරුද්ධත්වයන්, සේවක වර්ජන ආදියට හේතුව ලෙස මෙම ධනාත්මක ප්‍රතිචාරය නොමැතිකම කිව හැකිය. එමෙන්ම මෙම ප්‍රතිචාරය සමාජමය බලපෑමක් පමණක් නොව පාරසරික බලපෑමක් ද ඇති කරයි. මෙම ධනාත්මක ප්‍රතිචාරය ව්‍යවසායකයින් තම ක්‍රියා පටිපාටිය නිවැරදිව කරගෙන යමින් එය තම ආයෝජකයින්ගේ සුභසිද්ධිය හෝ ප්‍රතිලාභ වැඩිකිරීමට පමණක් සීමා නොකරන බවට දෙනු ලබන සහතිකයක් වනු ඇත.

- නවත් ප්‍රතිලාභයක් ලෙස , වගකීම් දරණ ව්‍යවසායකයින් හට සාර්ථක තරඟකාරීත්වයකට මුල පිරීමට හැකිවන අතර, තම ව්‍යාපාරයේ දිර්ග කාලීන පැවැත්ම ද මීත් තහවුරු කරයි. එමෙන්ම තම භාණ්ඩය හා එහි වෙළඳ නාමය ප්‍රචලිත වීමක් ද සිදුවේ. එමෙන්ම තම පාරිභෝගිකයන් , සැපයුම්කරුවන් ,සේවකයන් අතර ප්‍රචලිත වීමක් ද සිදුවේ.

- වගකීම් දරණ ව්‍යවසායකයින්ට වඩාත් කැපවීමෙන් යුතු සේවකයන් පහසුවෙන් බඳවාගැනීමට හැකිවන අතර, ඔවුන්ගේ පැවැත්ම ( සේවා කාලය ) ද දීර්ඝ වනු ඇත. විශේෂයෙන් උසස් කැපවීමෙන් යුතු සේවකයින් ආයතනයක වටිනා දේපලක් ලෙස හඳුන්වන අතර, ඔවුන් තම ආයතනයට ලබාදෙන කීර්ති නාමය ද උසස් වනු ඇත.

- එමෙන්ම හොඳ ව්‍යවසායකයින්ට අළුත් ආයෝජන මගින් නව ව්‍යාපාර ආරම්භ කිරීමට අවස්ථා සලසා ගත හැකි අතර, නව සොයාගැනීම් මගින් ව්‍යාපාර පුළුල් කිරීමට හැකි අවස්ථා ද වැඩිවනු ඇත. වෙනස් දෙයක් කිරීමට ඇති කුතුහලය නිසා නව නිෂ්පාදන කිරීමට ද හැකිවනු ඇත. මෙය තරඟකාරීත්වයේ වාසිය අත්කරගැනීමට ඉවහල් වනු ඇත.


- රාජ්‍ය අනුග්‍රහය හා අනදීම සමාජීය වගකීම් දරණ උසස් ව්‍යවසායකයින්ට ලැබෙන නවත් ප්‍රතිලාභයකි.

- එමෙන්ම ආයෝජකයින් තම ව්‍යාපාරයේ නවදුරටත් රැඳී සිටීමට යොමුවන අතර, නව ආයෝජනවලට රුකුල් දීමටත් ව්‍යවසායකයින්ව දිරිමත් කරනු ඇත.
- ව්‍යාපාර ආයතනයට සිදුවිය හැකි අර්බුද හා අවදානම් තත්ත්ව අවම කරගැනීමටත් හැකි වන අතර, එයට විශේෂ හේතුව වන්නේ, තමා වටා සිටින පාරිභෝගිකයින්, ආයෝජකයින්,සැපයුම්කරුවන් ඇතුළු සියළුදෙනා මෙම ව්‍යාපාරය කෙරෙහි සුභවාදිව බැලීමයි.
- එමෙන්ම දේශපාලනමය ප්‍රචලිතතාවන් මෙවන් ව්‍යාපාරවලට ලැබෙන අතර, විශේෂයෙන් දේශපාලකයින් ගේ උදව් මෙන්ම ඔවුන් ගේ මැදිහත්වීමෙන් සමාජයට සුභ සිද්ධියක් වන අයුරින් දැනට පනවා ඇති නීතිමය තත්ත්වයක් වෙනස්කර ගැනීමට ද හැකිවනු ඇත.

## සමාජයීය වගකීම් නොදරණ , මෙන්ම ඒගැන තැකීමක් නොකරන ව්‍යවසායකයින් හට මුහුණපෑමට සිදුවන ප්‍රශ්න

මෙවැනි ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර ගැන නිරන්තර සෝදිසියකින් මහජනතාව මෙන්ම නොයෙකුත් සංවිධාන ද සිටින අතර, ව්‍යාපාරවල දිගු පැවැත්ම ගැන සුරක්ෂිත භාවයක් ද නැත. එනිසා මෙම ව්‍යවසායකයින් හට කැපවීමෙන් යුතු සේවකයන් ලබාගැනීම අපහසු වනු ඇත. සේවක අර්බුද, ආයෝජකයන්ගේ අර්බුද වලට ද මුහුණු පැමට සිදුවේ. තම වෙළඳ නාමය මෙන්ම කීර්තිය ද කැපී නොපෙනෙනු ඇත. කෙටි කාලීන ලාභ ඉපයීමක් කළ හැකි වුවද දීර්ඝ කාලීන පැවැත්ම ගැන විශ්වාසයක් තැබිය නොහැකිය.

ශ්‍රී ලංකාවේ වැදගත් යැයි සැලකෙන ව්‍යාපාරිකයන් (සමාජයීය යුතුකම් නොපිරිහෙලා ඉටු කරන ) නිරතුරුවම තම සමාජයීය යුතුකම් හා වගකීම් මනා අයුරින් දැන සිටින අතර, ඒවාට දායකත්වයක් දී හැකි පමණින් ඒවා ඉටු කිරීමට යම්කිසි දිරියක් ගනු ලබයි. කෙසේ වෙතත්, ප්‍රායෝගිකව බලන කල මෙකී සමාජයීය වගකීම් සියල්ල ඉටු කිරීමට මොනම හෝ ව්‍යවසායකයකුට හෝ නොහැකි බව දන්නා කරුණක් වුවත් තම උපරිමයෙන් මෙම කර්තව්‍යය ඉටුකිරීමට දායකවීම සෑම ව්‍යවසායෙකුගේම වගකීමයි.




**වගකීම් උසුලන ව්‍යවසායකුගේ හැඟීම**

## කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයට විශේෂිත වූ කාර්මික සංවර්ධන මණ්ඩලීය පුස්තකාලය

ශ්‍රී ලංකාවේ පුස්තකාල අතර ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල පුස්තකාලය කුඩා හා මධ්‍යම පරිමාණ ක්ෂේත්‍රයට සුවිශේෂී මෙහෙවරක් ඉටුකරයි. තිස්නව වසරක (අවුරුදු 39) ක ඉතිහාසයක් තුළ නොයෙකුත් වෙනස්වීම්වලට ලක්වෙමින් අද ප්‍රධාන පෙළේ පුස්තකාලයක් පමණක් නොව තොරතුරු මධ්‍යස්ථානයක් වී ඇත. අප පුස්තකාලය මණ්ඩලයේ අනෙකුත් විස්තාරණීය සේවා අංශවලට නිරතුරු සහාය වෙමින් මණ්ඩලයේ පිටකොන්ද සේ නොසැලී සිටී. වෙනත් විශේෂ පුස්තකාලවලට සමගාවීම දේශීය හා විදේශීය ආයතන හරහා මුද්‍රිත හා මුද්‍රිත නොවන මාධ්‍ය ඔස්සේ තොරතුරු ලබාගෙන, එම තොරතුරු උසස් විඥාපණ රීතීන් අනුව මනාව සංවිධානයකර පරිශීලනයට අවස්ථාව සලසා ඇත.

මෙම කාර්ය සඳහා පළපුරුදු වෘත්තීය නිලධාරීන්ගේ සේවය නොමසුරුව ලැබෙන අතර, කාලීන අවශ්‍යතාවයක් ලෙස සලකා විෂය සංවිධානය පරිගණක ආශ්‍රිතව සිදුකරනු ලබයි.

ගතවූ තිස්නව වසරක් තුළ අප පුස්තකාලයෙන් ප්‍රයෝජනය ලබාගත් පිරිස අතර කර්මාන්තකරුවන්, ව්‍යවසායකයින්, කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුව දක්වන පුද්ගලයන්, විශ්ව විද්‍යාල හා පාසැල් සිසුන්, පර්යේෂකයින්, ආචාර්ය, මහාචාර්යවරුන් හා විදේශීය ආයෝජකයින් කැපී පෙනේ.

කාර්මික තොරතුරු, ග්‍රාමීය කර්මාන්තකරුවන් සහ ව්‍යවසායකයන් වෙත ගෙනයාමේ අරමුණින් ආරම්භකර ඇති ගම්පහ සහ මාතලේ තොරතුරු මධ්‍යස්ථාන මෑතකාලීනව ආරම්භකර ඇත.

**සතී මංජුලා**
පුස්තකාල සහකාර